**11 ශ්‍රේණිය**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

**පිළිතුරු පත්‍රය - I කොටස**

| අ.අ | පිළිතුරු | අ.අ | පිළිතුරු |
|---|---|---|---|
| 01 | 3 | 21 | 2 |
| 02 | 2 | 22 | 4 |
| 03 | 4 | 23 | 1 |
| 04 | 1 | 24 | 2 |
| 05 | 4 | 25 | 3 |
| 06 | 1 | 26 | 1 |
| 07 | 2 | 27 | 4 |
| 08 | 2 | 28 | 2 |
| 09 | 3 | 29 | 3 |
| 10 | 3 | 30 | 4 |
| 11 | 4 | 31 | 1 |
| 12 | 2 | 32 | 2 |
| 13 | 1 | 33 | 3 |
| 14 | 4 | 34 | 4 |
| 15 | 3 | 35 | 1 |
| 16 | 2 | 36 | 2 |
| 17 | 3 | 37 | 3 |
| 18 | 1 | 38 | 4 |
| 19 | 4 | 39 | 2 |
| 20 | 3 | 40 | 4 |

▲▲▲

11 ශ්‍රේණිය
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
පිළිතුරු පත්‍රය - II කොටස

(01) 1. සමූහ සන්නිවේදනය / කණ්ඩායම් සන්නිවේදනය

2. මුහුණේ ඉරියව් , ඇස්වල හැසිරීම , අඳුම් පැළඳුම් , අංග චලන

3. නිශ්චිත අරමුණක් තිබීම.
නිශ්චිත න්‍යාය පත්‍රයක් තිබීම.
නිශ්චිත ග්‍රාහක කණ්ඩායමක් සිටීම.
පූර්ව සැලැස්මක් තිබීම්
නිශ්චිත වේලාවක් තිබීම.

4. පරිගණක මුද්‍රණ යන්ත්‍රය ( Printer )
ඡායා පිටපත් යන්ත්‍රය ( Photo Copy Machine )
ඩුප්ලෝ යන්ත්‍රය ( Digital Duplicator Machine )
රෝනියෝ යන්ත්‍රය ( Roneo Machine )

5. යවන්නා , ලබන්නා , වේලාව ( කාලය ) , දිනය , කාරණය , ආරාධිත අමුත්තන් , ලිපිනය , දුරකථන අංකය.

6. අවම වශයෙන් පිටු 49 ක් තිබීම.

7. මුද්‍රිත මාධ්‍යය ⟶ පුවත්පත් , සඟරා
විද්‍යුත් මාධ්‍යය ⟶ ගුවන් විදුලිය , රූපවාහිනිය

8. අධ්‍යක්ෂවරයා විසින් හසුරුවන නළු නිළියන් නොමැත.
මුල සිට අග දක්වා නිශ්චිත කතාවක් නොමැති වීම.
යථාර්ථය ඒ ආකාරයෙන් නිරූපණය කිරීම.
පසුබිම් කථනය යොදා ගැනීම.
වේෂ නිරූපණය , කලා අධ්‍යක්ෂණය අවම මට්ටමක පැවතීම හෝ නොපැවතීම.
මූලික අරමුණු තොරතුරු ලබාදීම.

9. ක්ෂණිකව ලබා ගැනීමේ පහසුව
සංස්කරණය කිරීමේ පහසුව
ඡායාරූප ගණනාවක් අතරින් සුදුසු ඡායාරූපය තෝරා ගැනීමේ හැකියාව
සරල ක්‍රියාවලියක් වීම
අඩු පිරිවැය

10. වෙබ් අඩවිය / වෙබ් ලිපිනය
පාසලේ ඉතිහාසය
විදුහල්පතිතුමා ප්‍රමුඛ ගුරු මණ්ඩලයේ ඡායාරූප
මෙහෙවර ප්‍රකාශය
පාසලේ දැක්ම
ජයග්‍රාහී තොරතුරු
ඉදිරි පාසල් උත්සව
පාසලේ සැලැස්ම සහ මාර්ග සැලැස්ම

(02) 1. සංදේශය පොදුය.

සන්නිවේදකයා සහ ග්‍රාහකයා අභිමුඛ නොවේ.

සංවිධිත ආයතනයක් මගින් ක්‍රියාත්මක වේ.

ග්‍රාහක පද්ධතිය ඉතා විශාල හා පැතිරුණු ස්වභාවයක් ගනියි.

වෘත්තීය සන්නිවේදන කටයුතු කරයි.

මූලික වශයෙන් ඒක මාර්ගිකව සිදුවේ.

තාක්ෂණික උපකරණ භාවිතයට ගැනේ.

සන්නිවේදකයා සහ ග්‍රාහකයා අතර ඇත්තේ දුරස්ථ සම්බන්ධතාවයකි.

සාපේක්ෂව ග්‍රාහක ප්‍රතිචාර ප්‍රමාද වේත

ජන මාධ්‍යය / සන්නිවේදනය සමූහ කාර්යය පද්ධතියකි.

2. ප්‍රවෘත්ති සම්පාදනය / විනෝදාස්වාදය

3. මාධ්‍ය සියල්ල එකට හමුවීම මාධ්‍ය අභිසාරිතාවයයි.

4. විවිධ ඡායාරූප ලබා ගැනීම.

විවිධ දර්ශන ලබා ගැනීම.

විවිධ වාර්තා ලබා ගැනීම.

සෙසු මාධ්‍ය වලට වඩා ඉක්මණින් තොරතුරු ලබා ගත හැකිය.

(03) 1. පොත් , පුවත්පත් , සඟරා , පෝස්ටර් අත් පත්‍රිකා

2. පිටු 49 කට නොඅඩු වාර සඟරා හෝ මුද්‍රිත කඩදාසි ගොනුව පොතක් බව යුනෙස්කෝව අර්ථකථනය කරයි.

3. පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය

4. සිසු පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

(04) 1. මුද්‍රිත පුවත්පතේ ම විද්‍යුත් පිටපත ( E-Paper ) අනුතර්ජාලයෙහි පමණක් පළ කෙරෙන විද්‍යුත් පුවත්පත් ( Online - Paper )

2. තාක්ෂණිකව පුවත් දැනගැනීමේ හැකියාව

ගබඩා කර ගැනීමේ පහසුව

නැවත නැවත කියවිය හැකි වීම

තොරතුරු විෂයයන් අනුව වර්ග කරමින් පළකොට තිබීම

යාවත්කාලීන කිරීමේ පහසුකම් වැඩිවීම

ක්ෂණික පාඨක ප්‍රතිචාර ලැබීම

3. විද්‍යුත් පෙළ පොතේ රූප එහි අන්තරගත වීමයි.

( පුවත් පත් භාෂා භාවිතය )

4. දීර්ඝ වැකි භාවිතා කල හැක

සංඛ්‍යා දත්ත නිශ්චිතව දැක්විය හැක

භාෂාවෙන් කියවෙන දේ උද්දීපනය කර පෙන්වීමට

සංකීර්ණ තොරතුරු ඉදිරිපත් කළ හැක

( ගුවන් විදුලි භාෂා භාවිතය )

සරල විය යුතුය

කෙටි වැකි භාවිතය

පරිකල්පනීය භාෂා භාවිතය

භාවිත භාෂා උච්චාරණය කරන අයුරු දැන ගැනීම

(05) 1. **<u>ප්‍රබලතා</u>**

ගුවන් විදුලිය අතිශය ක්ෂණික මාධ්‍යයකි.

ගුවන් විදුලිය එසැනින් අසන්නනට යොමුවේ.

ගුවන් විදුලිය සමග ශ්‍රාවකයාට පහසුවෙන් සම්බන්ධ විය හැකිය.

ගුවන් විදුලියට භූගෝලීය බාධක විරලය.

ගුවන් විදුලිය අඩු වියදම් මාධ්‍යයකි.

ගුවන් විදුලිය පහසුවෙන් හැසිරවිය හැකි මාධ්‍යයකි.

**<u>දුබලතා</u>**

ගුවන් විදුලිය හුදෙක් ශබ්දය පාදක වූ මාධ්‍යයකි.

ගුවන් විදුලි වැඩ සටහනක් කනට ඇසෙන්නේ එක් වරක් පමණි.

ඇසෙන්නගේ අවධානය ගුවන් විදුලි වැඩ සටහනෙන් ඉවතට යොමුවීමට ඇති ඉඩකඩ වැඩිය.

ගැඹුරු සංකීර්ණ අදහස් ග්‍රාහකගත කිරීමේ අපහසුතාව.

2. ප්‍රවෘත්ති වැඩසටහන්

සඟරාමය වැඩසටහන්

නාට්‍යමය වැඩසටහන්

සංගීත වැඩසටහන්

සජීවි වැඩසටහන්

සම්මුඛ සාකච්ඡා

3. වැඩසටහනේ පරමාර්ථය

වැඩසටහන ඉදිරිපත් කරන මාදිලිය

ඒ සඳහා භාවිතා කරන ආකෘතිය

ක්‍රම ග්‍රාහක කණ්ඩායම

වැඩසටහන ඉදිරිපත් කරන ගුවන කාලය

**( කරුණු 2 ක් විස්තර කළ යුතුය )**

4. කොන්දේසි 04 කි.

භාෂාමය ස්වරූපය

ආමන්ත්‍රණ ස්වරූපය

ශ්‍රවණ ස්වරූපය

ශබ්ද ස්වරූපය

(06) 1. රූපවාහිනී මාධ්‍යය ශ්‍රව්‍ය - දෘශ්‍ය මධ්‍යයකි

සමීප මාධ්‍යයකි

සජීවී මාධ්‍යයකි

ජන මාධ්‍යයකි

අස්ථායී මාධ්‍යයකි

වියදම් අධික මාධ්‍යයකි

2. ප්‍රවෘත්ති

වාර්තා වැඩසටහන් , ටෙලි නාට්‍යය , සංගීත වැඩසටහන් , සාකච්ඡා සංවාද , සඟරාමය වැඩසටහන් , යථාකාරි රූපවාහිනී වැඩසටහන් , සජීවි වැඩසටහන්

3. ඒකාංගික නාට්‍යය - එක කොටසකින් අවසන් වෙයි.

ප්‍රාසාංගික නාට්‍යය - කොටස් ගණනාවක් දැකිය හැකිය.

විවිධාංගික නාට්‍යය - කොටසින් කොටස කතාවේ තේමාව වෙනස් වෙයි.

4. න්‍යායික හා තාර්කික සිසු පිළිතුරු

(07) 1. නැත.

සියලු ජනමාධ්‍යයන්ට පොදු ආචාර ධර්ම පද්ධතියක් නැත. එය එසේ වුවද ප්‍රවෘත්තියක නිවැරදි බව, සමතුලිත බව, පැහැදිලි බව විශ්වාසනීයත්වය රැක ගැනීම සියලුම ජන මාධ්‍යවේදීන්ගේ ප්‍රධාන වගිකීමය. එසේම එක් එක්ජන මාධ්‍යයට මෙන්ම එක් එක් ජනමාධ්‍ය ආයතනවලටද විශේෂිත ආචාර ධර්ම පද්ධතිය තිබිය හැක. එවිට ඒවා පිළිපැදීමට ඒ ඒ ජන මාධ්‍යවේදී හූ බැඳී සිටිති.

2. නැත.

කාලීන හා ප්‍රබල සිදුවීම් වලට අමතරව ප්‍රවත්තියක අගය මැනෙන තවත් වෙන නිර්ණායකයන් ගණනාවක් තිබිය හැක. එවිට සඳහන් කල එම කරුණු දෙකම පමණක් සෑම විටම සීමා වීම අවශ්‍ය නැත. පහත පුවත් අගයන් රැසක් ද ප්‍රවෘත්ති ඔස්සේ ලැබේ.

කැපී පෙනීම , බලපෑම , සමීප බව , මානව ඇල්ම , නැවුම බව ,

අසාමාන්‍ය බව , ගැටුම්කාරී බව

3. ඔව්.

* ඡායාරූපයක් ගැනීමේ සිට එහි පිටපත් ලබා ගැනීම දක්වා කාර්යාවලිය යාන්ත්‍රික කැමරුවලට සාපේක්ෂව ඉතා අපහසු වීම.

*ලබාගත් ඡායාරූප ඒ වෙලාවේම නැරඹිය හැක.

* අනවශ්‍ය ඡායාරූප මතකයෙන් ඉවත් කළ හැක.

* ඡායාරූපවල දෝෂයක් හෝ අඩුවක් හෝ තිබේ නම් නැවත එම ඡායාරූපය ගැනීමට ඉඩ ලැබීම.

* යාන්ත්‍රික කැමරාවක සේයා පටලවලට වඩා ඩිජිටල් කැමරාවක විද්‍යුත් මතක කාඩ්පත් ( Memory Card ) නැවත නැවත භාවිතා කළ හැකි බැවින් වියදම් අඩු වේ.

4. ඔව්. එකගවේ.

* ඉගෙනුම් ක්‍රියාවලිය කාර්යක්ෂම වේ.

* ඉගෙනුම තාත්වික වීම.

* වේගයෙන් පාඩමක් ඉදිරිපත් කළ හැක.

* සිසුන්ගේ පෙළඹවීම වැඩි දියුණු වීම.

* සංකීර්ණ සංකල්ප සරලව අවබෝධ කර ගත හැක.

* සිසුන්ගේ ප්‍රබෝධය වර්ධනය වීම.

* ප්‍රිය ජනක ඉගෙනුමක් සඳහා

* වචනයෙන් ලබන අර්ථයට වඩා වැඩි පරාසයක පාඩමේ වූ අර්ථයන් විහිදවීම තුලින් අවධාරණය කිරීමට හැකිවීම.

* භාෂාමය හැකියාව , කථනය වර්ධනය කිරීම.

* ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ ඒකාකාරී බව දුරලීම.

* කාල කළමණාකරණය මැනවින් සිදුකර ගැනීමට.

* ගුරු - සිසු සම්බන්ධතා වර්ධයට

▲▲▲